**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු නිසි පරිදි සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | | **ආදායම් සංකේතාංකය**<br>**20:02:03:00 - ලාභ** | | |
| | (i) | 20:02:03:00 - ලාභ ආදායම් සංකේත වෙනුවෙන් 2022 වර්ෂය සඳහා රු.34,700,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී රැස්කර ඇති තත්‍ය ආදායම රු.22,004,727,426 ක් හෙවත් සියයට 63 ක් බව නිරීක්ෂණය විය. | රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හමුවේ වුව ද 2022 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 20.02.03.00 යටතේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 63ක ආදායම් ප්‍රමාණයක් රැස්කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හැකි වී ඇත. | ආදායම් රැස් කර ගැනීමට තිබෙන ආයතන පිළිබඳව නිවැරදිව පුරෝකථනය කර වඩාත් නිවැරදිව ආදායම් ඇස්තමේන්තු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | මෙම ආදායම් සංකේතාංකයට අදාලව ආයතන 9 ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 98 ත් අතර පරාසයක පැවතුණි. | ආදායම් ඇස්තමේන්තු වලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීමට හේතු ඉදිරිපත් කර තිබුණි. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |
| (iii) | 2022 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 09 ක් මඟින් රු. මිලියන 10,160 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යවසායන්වලින් කිසිඳු ආදායමක් රැස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී කිසිදු ආදායමක් රැස් කර ගෙන නොතිබූ බව සඳහන් කර තිබූ රාජ්‍ය ව්‍යවසායන් 09 සම්බන්ධ හේතු ඉදිරිපත් කර තිබුණි. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |
| (iv) | සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 03 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු. මිලියන 1,049.9 ක ලාභ ආදායමක් ලබාගෙන තිබුණි. | 2022 වර්ෂය තුළ උච්චව පැනනැඟුණු රජයේ ප්‍රාග්ධන ගැටළු හේතුවෙන් මෙම ආයතන වෙතින් ඇස්තමේන්තු නොකළ ද, ලාභ, මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමක් සිදු කරන ලදි. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |
| (v) | රාජ්‍ය ව්‍යවසායන් 05 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, එම ව්‍යවසායන් විසින් ඇස්තමේන්තු කළ ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 75 ක සිට 540 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභ ආදායමට දායක වී තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා |

| | | | |
|---|---|---|---|
| | | | ආදායම් රැස් කර ගැනිම වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |
| (ආ) | **ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම** | | |
| (i) | 20:02:04:00 - ලාභාංශ ආදායම් සංකේතය සඳහා 2022 වර්ෂයේදී රු.6,300,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97 ක් හෙවත් රු.6,087,754,386 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කරගෙන තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |
| (ii) | රාජ්‍ය ව්‍යවසායන් 5 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 33 ක සිට සියයට 150 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වි තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතු වීම. |
| (iii) | රාජ්‍ය ව්‍යවසායන් 11 කින් ලාභාංශ ආදායම් ලෙස ඇස්තමේන්තු කළ ආදායමට වඩා තත්‍ය ආදායම ලැබීමේ අඩුවීම සියයට 3 ක සිට 67 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මෙම ආයතනවල පවතින කාරක ප්‍රාග්ධන ගැටළු සලකා බලන මූල්‍ය වර්ෂයන් තුළ අඩු ලාභදායීත්ව හෝ ශුද්ධ අලාභය වාර්තා කිරීම හා ක්‍රියාත්මක කිරීමට යෝජිත ආයතනික වැඩසටහන් සඳහා මුදල් වෙන් කිරීමට සිදු වීම වැනි කරුණු හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම ලබා ගැනීමට නොහැකි වී ඇත. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීම වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇතිනම් සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු බව දක්වා තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කර තිබුණි. | | |
| (i) | වැය විෂයයන් 4 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.508,152,000 ක ප්‍රමාණයක් එනම් සියයට 0.4 ක සිට සියයට 125 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. | පහත සඳහන් කරුණු හේතු වී ඇත.<br>• 2022 වර්ෂයේ 1205 වැය විෂය සඳහා ප්‍රතිපාදන අනුමත වී නොතිබීම.<br>• අනපේක්ෂිත අයුරින් වියදම් ඉහළ යාම.<br>• ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදලට අදාළ රු:25,565,718,757 ක ශේෂය නිරවුල් කිරීම සඳහා 241-1-1-2301 (30) යන වැය විෂයයට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම වැනි හේතු මත මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමක් සිදු කරන ලදී. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | වැය විෂයයන් 14 ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සලසා ගැනීම හේතුවෙන් එකතුව රු.508,152,000 ක් එනම් සියයට 0.5 සිට සියයට 99 දක්වා පරාසයකින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන අඩු කරගෙන තිබුණි. | පහත සඳහන් කරුණු හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.<br>• දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු පැවතීම.<br>• ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව වියදම් සැළකිය යුතු ලෙස පාලනය කිරීම.<br>• දේශීය අරමුදල් යොදා ගනිමින් සිදු කරන ලද විදේශ අධ්‍යයන චාරිකා, පුහුණුවීම් සීමා කිරීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

- වෙන් කළ වාහන හිමි නිලධාරින් වෙනුවෙන් ලබා දෙන ඉන්ධන ප්‍රමාණය අඩුවීම.
- නව ගිවිසුමකට එළඹීම වෙනුවට පවතින ගිවිසුමේ කල් බදු කාලය දීර්ඝ කිරීම.
- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඩෝමන්ට් හිමිකම ගෙවීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොමැතිවීම.
- බැංකුව විසින් ලබා දෙන දේපල ණය සීමා කිරීම.

(ඇ) වැය විෂයයන් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නොසැසඳෙන අවස්ථා නිරීක්ෂණය විය.

| වැය විෂයය හා විස්තරය | වැය ලෙජරයට අනුව වර්ෂයේ වියදම | භාණ්ඩාගාර මුද්‍රිත අනුව වර්ෂයේ වියදම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 241-1-1-2301-008 ප්‍රාග්ධන දායකත්වය - ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 151,552,659 | 290,897,758 | 7,139,345,099 |
| 241-1-1-2301-30 ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල | 565,718,757 | 543,438,157 | 1,622,280,600 |

මේ වන විට වැය ලෙජරයේ අදාළ ගනුදෙනුව සටහන් කර ඇති අතර, ඉදිරියේදි මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

වැය ලෙජරයන් කාලීනව භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳීමක් කළ යුතු වීම.

## 2.3 බැඳීම් හා බැරකම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) හි දක්වා ඇති බැරකම් ප්‍රමාණයට අමතරව රු.361,218 ක බැරකම් හා බැඳීම්වලට සමාලෝචිත වර්ෂයේදී එළඹ තිබුණි. | 2022 වර්ෂයට අදාළව එළඹී ඇති බැරකම්, බැරකම් ලේඛනයට ඇතුළත් කිරීම අතපසුවීමකින් මඟ හැරී ඇති අතර, මින් ඉදිරියට මෙවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට අපේක්ෂාවෙන් එළඹ තිබුණු බැරකම් නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතු වීම. |
| (ආ) | මු.රෙ. 94 (1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සේවයක් හෝ සැපයුමක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු වල ඒ සඳහා වූ මුදල් ප්‍රතිපාදන ඉක්මවා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය යුතු වුවද, වැය විෂයයන් 2 ක් යටතේ ඉතිරිවීම් ඉක්මවා රු.253,293 ක බැරකම්/ බැඳීම්වලට එළඹ තිබුණි. | මින් ඉදිරියට බැරකම් වලට එළඹීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් වීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2022 හි 10 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයට අදාළව කාර්යසාධන වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින අතර, එය ඉතා ඉක්මණින් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 මැයි 22 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1550/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 7 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශ පත්‍රයක් සම්බන්ධයෙන්ම එවැනි ටිකට්පත් විකිණීමේ ආකාරය සහ හෝ නිකුත් කිරීම නොසලකා ඇ.ඩො. 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කරනු ලැබිය යුතු බවත්, එම ගැසට් පත්‍රයේ 8 ඡේදය ප්‍රකාරව එලෙස එකතු කරගනු ලබන අධිභාර මුදල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ හැකි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බවත් දක්වා ඇත. ඒ අනුව 2008 අගෝස්තු 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එම අධිභාරය ලෙස රු.මිලියන 16,982 ක් එකතු කර ගෙන තිබුණ ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් 2017 ජුනි 12 දින නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය වන "මෙම අධිභාරය තවදුරටත් අය කර ගැනීමට හැකියාව ඇති බවත්, එම අධිභාර මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ නීතිමය බැඳීමක් පවතින බවත්" සඳහන් කර 2017 අප්‍රේල් 07 දිනැති නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය ද සමඟ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වන විටත් මෙම අධිභාර මුදල සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අයකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | රජයේ බදු නොවන ආදායම් ලෙස රාජ්‍ය ව්‍යාපාර වෙතින් අයබදු හා ලාභාංශ එකතු කිරීමේ කාර්යභාරය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර, බදු ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. තවද, උක්ත අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර වී නොමැති බව නිරීක්ෂණය වන අතර ඒ අනුව, එකී අධිභාරය අයකර ඒකාබද්ධ අරමුදලට බැර කරන මෙන් භාණ්ඩාගාර ලේකම් විසින් විගණකාධිපතිට පිටපතක් සහිතව නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත, 2023.04.26 දිනැතිව දන්වා යවා ඇති බව දන්වමි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන ආදායම් රැස් කිරීම් සම්බන්ධව විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

(ආ) **ප්‍රාග්ධන දායකත්වය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රාජ්‍ය සංස්ථා සහ කොටස් හිමිකාරිත්වය දරන රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය සමාගම් 13 ක් විසින් ඉදිරිපත් කරන ලද ඍජු ශේෂ සනාථ කිරීම් අනුව 2022 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 985,745 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 149,875 ක් වීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 835,870 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. අදාළ නිවැරදි කිරීම් 2023 වර්ෂයේ දී සිදු කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ. | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ඍජු ශේෂ සනාථකිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 07 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,877 ක් අඩුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. අවශ්‍ය නිවැරදි කිරීම් 2023 වර්ෂයේ දී සිදු කිරීමට සටහන් කර ගතිමි. | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | රාජ්‍ය සමාගමක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව විගණනයේදී කල ගණනය කිරීමේදී 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 14,476 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල රු.මිලියන 9,336 ක් වැඩියෙන් ප්‍රාග්ධන දායකත්වය දක්වා තිබුණි. | විගණන විමසුම සමඟ එකඟ වේ. මේ පිළිබඳව අවශ්‍ය නිවැරදි කිරීම් 2023 වර්ෂයේ දී සිදු කරන බව දන්වමි. | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iv) | ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය Capital Adequacy (Tier 1) වැඩිදියුණු කර ගැනිම සඳහා ඊට පෙර ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ලබාගෙන තිබූ රු.මිලියන 175 ක මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය මුදල හිලව් කර ගනිමින් 2022 දෙසැම්බර් මස | 2022 දෙසැම්බර් 15 දින රු.මිලියන 175 ක් වටිනා කොටස් 6,183,946 ක් නිකුත් කර තිබුණ ද, කොටස් නිකුත් සහතිකය මහා භාණ්ඩාගාරය වෙත ලැබී නොතිබුණු බැවින් රජයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොවී තිබුණු අතර, එය ලද විගස ගිණුම්වලට | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | 15 දින රු.මිලියන 175 ක් වටිනා කොටස් 6,183,946 ක් නිකුත් කර තිබුණ ද, එය 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | යුතු වීම. |
| (v) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 1,405,204 ක් වූ අතර ඉන් රු.මිලියන 109,625 ක් එනම් සියයට 8 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය. | මහා භාණ්ඩාගාරය, මෙම ආයතන සියල්ලෙහිම තනි අයිතිකරු වේ. ඒ අනුව, එම ආයතනවල පවතින කාරක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් දායකවීම් එම ආයතන වෙත සිදු කරනු ලබන ප්‍රාග්ධන දායකත්වයන් ලෙස සැලකීම සිදු කළ හැකි බව දන්වමි. | පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීම තුළින් ආයතනවල ප්‍රාග්ධන දායකත්වයන් වැඩිවීමක් සිදු නොවන බැවින් නිසි ක්‍රමවේදයක් ඒ සඳහා අනුගමනය කළ යුතු වීම. |
| (vi) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩි වීම රු.මිලියන 1,405,204 ක් වූ අතර ඉන් රු.මිලියන 1,246,401 ක් එනම් සියයට 89ක් 2023 පෙබරවාරි 07 දිනැති අමප 23/0154/604/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ රජය සතු ව්‍යාවසායන්හි හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පැවරීම යටතේ ගලපන ලද අගයන් නිසා වූ බලපෑම බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ. | විගණන විමසුම සමඟ එකඟ වෙමි. රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පැවරීම මැයෙන් සිදු කරන ලද අංක MF/PE/001/CM/2023/005 හා 2023.01.20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වගකීම් රජයේ ශේෂ පත්‍රයට පවරා ගැනීම සිදු කරන ලදී. | රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් රජයට පවරා ගැනීම හේතුවෙන් රජය මූල්‍ය අර්බුදයකට බලපෑ හැකි බැවින් එම වගකීම් නිරවුල් කිරීමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම. |

| අංකය | ආයතනය | රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් යටතේ රජයේ ශේෂ පත්‍රයට ගැලපූ අගය |
|---|---|---|
| ------- | ---------- | ---------------------- |
| | | රු. |
| 1 | ලංකා විදුලිබල මණ්ඩලය | 362,307,620,369 |
| 2 | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 884,093,386,477 |
| | | ---------------------- |
| | එකතුව | 1,246,401,006,846 |
| | | ============ |

| | | |
|---|---|---|
| (ඇ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 52 කට අදාල ව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පමණි. ඒ අනුව, ආයතන 248 ක එනම් සියයට 83 කට අදාල ව එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ආයතන 305 අතරින් වානිජ ව්‍යාපාර කටයුතු වල යෙදෙන සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු සමාගම් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු බවට හඳුනාගෙන ඇති අතර, ආයතන අතුරින් උපාය මාර්ගික වශයෙන් වැදගත් ආයතන 52 ක් සෘජුවම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලබයි. අක්‍රීය රාජ්‍ය ව්‍යාපාර වල වාර්ෂික වාර්තා පිළියෙල කිරීමක් සිදු නොවන අතර ප්‍රාදේශීය වතු පෞද්ගලික අංශය සතු වන බැවින් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට සභාගත කිරීමට අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය මඟ පෙන්වීම මෙම ආයතන වෙත ලබා දෙනු ලැබේ.<br>සුළු කොටස් හිමි සමාගම්, උප සමාගම්, අනුබද්ධිත උප සමාගම් සහ ආශ්‍රිත සමාගම් වල වාර්ෂික වාර්ථා සෘජුවම පාර්ලිමේන්තුවට සභාගත කිරීමක් සිදු නොවන අතර මව් සමාගම් හරහා ඒකාබද්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරනු ලබයි. | අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම. |
| (ii) ඉදිරිපත් කළ තොරතුරු අනුව, එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් 2021 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 23 ක් පමණි. කෙසේ වෙතත් එම රාජ්‍ය ව්‍යවසායන් 23 අතුරින් වාර්ෂික වාර්තා 17 ක් පමණක් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ විගණිත දිනය වූ 2023 මැයි 24 වන දින වන විට සටහන් වී තිබුණි. | සටහන් කර ගතිමි. | අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2022 වර්ෂය වෙනුවෙන් එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත විගණිත දින වන විට වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 5 ක් පමණි. | සටහන් කර ගතිමි. | අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම. |
| (iv) | 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් මෙම සියළු ආයතන වලට අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්ට, ආයතන සභාපතිවරුන්ට සහ භාණ්ඩාගාර නියෝජිතයින්ට තම අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු බවට ලිඛිතව දැනුම් දී ඇත.<br>භාණ්ඩාගාර නියෝජිතයන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022.11.24 දින මුදල් අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. වැඩිම රාජ්‍ය ව්‍යාපාර ප්‍රමාණයක් පවතින අමාත්‍යාංශ ත්‍රිත්වයක් වන කර්මාන්ත අමාත්‍යාංශය 2022.09.27 දින ද අධ්‍යාපන අමාත්‍යාංශය 2023.05. 22 දින ද හා සෞඛ්‍ය අමාත්‍යාංශය 2023.01.25 දින ද දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.<br>මෙම රාජ්‍ය ව්‍යවසායන් නීති රීති රෙගුලාසි හා මහ පෙන්වීම් වලට අනුකූල වීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම රේඛීය අමාත්‍යාංශයට ද අධීක්ෂණය කිරීමේ වගකීමක් ඇත. කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් සිදු කරනු ලබන අධීක්ෂණ කටයුතු මේ වන විට පුළුල් කර ඇත. | ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 07 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03ක් පැවති අතර, ද්විතික මට්ටමේ නිලධාරීන්ගේ සංවර්ධන නිලධාරී සේවයේ අතිරික්තතා 03 ක් සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු 4 ක් පැවතුණි. | 2022.12.31 දිනට මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 03 මේ වන විට පුරප්පාඩු 02 ක් දක්වා අඩු වී ඇති අතර, අදාළ පුරප්පාඩු 02 සඳහා ද සුදුසු නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර ගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇත. සංවර්ධන නිලධාරි සේවයේ අතිරික්ත නිලධාරීන් තිදෙනාගෙන් එක් නිලධාරියෙකු වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත ස්ථාන මාරු වී ගිය අතර ඉතිරි නිලධාරින් දෙදෙනාගේ තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. ඒ අනුව, මේ වන විට සංවර්ධන නිලධාරි සේවයේ අතිරික්තයක් නොපවතී. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු 04 මේ වන විට සම්පූර්ණ වී ඇත. | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යාවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම. |
| (ආ) | කර්මාන්ත අමාත්‍යාංශය මඟින් වැටුප් ගෙවනු ලබන එක් නිලධාරියෙකු 2011 ජනවාරි 01 දින සිට වසර 12 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සේවය කරන බව නිරීක්ෂණය විය. | අදාළ නිලධාරිණිය රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවය කරන ලද අතර එම ආයතනය වසා දැමීමෙන් පසු අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත. අදාළ නිලධාරිණියගේ ඉල්ලීම මත සහ කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟතාව මත විධිමත් අනුමැතියකින් පසුව මෙම නිලධාරිණිය එම අමාත්‍යාංශයේ රාජකාරි සිදු කරනු ලැබේ. | අදාළ නිලධාරියාගේ සේවය ලබා ගැනීම විධිමත් කළ යුතු වීම. |